සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

සැප්තැම්බර් මාසය - 1 සතිය 14 පාඩම (කඨින පූජෝත්සවය)

1)මෙම වචනවල තේරුම් වරහන් තුළින් සොයා ලියන්න

1.කඨින- ............... 2.අන්‍ය- ................ 3.චීවරය - ................. 4.පවිත්‍ර - ............ 5.හස්තීන් - ....................

( වෙනත් , පිරිසිදු , ඇතුන් , බලවත් , සිවුර)

2) “බුදු රජාණන් වහන්සේ සහජීවනයට මුල් තැන දෙමින් වස් විසීම අනුදැන වදාළසේක”. මෙම කියමන පැහැදිලි කරන්න.

3)මෙම වැකිවල සත්‍යාසත්‍යභාවය වරහන් තුළ සටහන් කරන්න.

1.කඨින පින්කම පැවැත්වෙන්නේ වස් කාලය පදනම් කර ගෙනය. ( .......... )

2.පෙර වස් වසන භික්ෂූන් වහන්සේ පොසොන් පුර පසළොස්වක පොහොය දින වස් සමාදන් වෙති. ( .......... )

3.පසු වස් වසන භික්ෂූන් වහන්සේ නිකිණි පුර පසළොස්වක පොහොය දින වස් සමාදන් වෙති. ( .......... )

4.කඨින පින්කම වසරකට දෙවතාවක් සිදු කරයි. ( .......... ) 5.කඨින පෙරහැර ආරම්භ වන්නේ දහවල ය. ( .......... )

4)කෙටි පිළිතුරු සපයන්න

1. වස් කාලය තුළ විහාරස්ථානවල සිදු කෙරෙන පින්කම් මොනවා ද? 2.කඨින පෙරහැර සිදු කරන්නේ ඇයි?

3. .කඨින පෙරහැර තුළින් සහනශීලීත්වය පෙන්නුම් කෙරේ.මෙයට හේතු වූ කරුණු කීපයක් ලියන්න.

4.වර්තමානයේ කඨින පින්කමට එක් වී ඇති විචිත්‍රවත් අංග මොනවා ද? 5.වස්සාවාසික සිවුරු යනු මොනවා ද?

6.වස් වසන කාලය තුළ භික්ෂූන් වහන්සේලාගේ චර්යා රටාව කෙබඳුද’යි විස්තර කරන්න.

7. කඨින පින්කම අතීතයේ පටන් සිදු කළ බව හෙළි කරන සාක්ෂි කීපයක් සඳහන් කරන්න.

8.”මහණෙනි, වස්සාන කාලය තුළ වස් විසීමට අවසර දෙමි” යන්න බුදු වදනින් ලියන්න.

5)වරහන තුළ ඇති වචන යොදා ගෙන හිස්තැන් පුරවන්න.

1.පෙර දින සිට පැවැත්වෙන සර්ව රාත්‍රික පිරිත් දෙසුම අවසන් වීමත් පෙරහැර පන්සලට ළඟා වීමත් ......... සිදු වේ.

2.කඨින පෙරහැර පන්සලට ළඟා වන්නේ ....... ............. ජේත වේලාවට ය. 3.කඨින දානය ද .......... පෙන්නුම් කරයි.

4............... ධර්ම දේශනයෙන් කඨින පූජෝත්සවය නිමාවට පත් වේ. 5.වස් කාලය ................. කාලයක් සේ සැළකේ.

(අවිහිංසාවාදී / කොස් නැටි / සහජීවනය /එක විට / කඨිනානිසංස)

6)නිවරදි ව යා කරන්න -

| | |
|---|---|
| කඨින වස්ත්‍රය ගෙන යාම | උදේ පාන්දර |
| කඨින පෙරහැර ආරම්භය | ජාතිකාභිමානය වඩවයි |
| කඨින චීවර පූජාව | බලවත් පූජාවකි. |
| කඨින පූජෝත්සවය | වර්ෂා කාලය |

6) *ආගමික උත්සව හා සහජීවනය* මැයෙන් රචනයක් ලියන්න 7)අන්‍යාගමික උත්සව මැයෙන් පොතක් හදන්න.